© [සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved.]

3210

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා - (2017/2018)
## අවසාන පරීක්ෂණය - 2019

| PE0180 (PE780) | ඉගැන්වීමේ ශිල්පක්‍රම<br>TEACHING TECHNIQUES |
|---|---|

2019.09.28 | පැය 1300 - පැය1600 | කාලය - පැය තුනයි.

**උපදෙස් :-**

- I කොටසේ සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- II කොටසේ "අ" කොටසින් **එක්** ප්‍රශ්නයක් ද "ආ" කොටසින් ප්‍රශ්න **හතරක්** ද බැගින් තෝරා ගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- II කොටසේ පිළිතුරු පත්‍රය, I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණන්න.
- අත් අකුරු පැහැදිලි ව ලියන්න.
- II කොටසේ සෑම පිළිතුරක් ම නව පිටුවකින් අරඹන්න.

---

විභාග අංකය:..........................................................

### I කොටස

**වඩාත්ම ගැළපෙන වරණයේ අංකය තෝරා එය දී ඇති වරහන තුළ ලියන්න.**

01. සම්පත් පුද්ගලයකු පාඩම් සැලසුම් ආකෘති පත්‍ර තුනක් ගුරුවරුන්ට සන්සන්දනය කිරීමට අවස්ථාව ලබා දී ඒවා නම් කිරීමට උපදෙස් දෙන ලදී. එම පිළිතුරු අතරින් පාඩම් සැලසුම් ආකෘති නම් කිරීමට වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

    1. අරමුණු පාදක, නිපුණතා පාදක සහ ඉගෙනුම් පල පාදක කරගත් ආකෘතීන් ය.
    2. පරමාර්ථ, අරමුණු සහ සුවිශේෂී අරමුණු පාදක ආකෘතීන් ය.
    3. අරමුණු පාදක, නිපුණතා පාදක සහ සුවිශේෂී අරමුණු පාදක ආකෘතීන් ය.
    4. අරමුණු පාදක, සුවිශේෂී අරමුණු පාදක සහ ඉගෙනුම් පල පාදක ආකෘතීන් ය. (........)

02. පාඩම් සැලසුම්කරණයේ දී යොදා ගනු ලබන විවිධ ආකෘතීන්හි ඇති පොදු ලක්ෂණ හඳුනා ගන්නා ලෙසට දෙන ලද ක්‍රියාකාරකමකට ගුරු සිසුන් දක්වන ලද පහත ලක්ෂණ කාණ්ඩ අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

    1. කාලය, නිපුණතා, තක්සේරු නිර්ණායක, සම්පත් භාවිතය.
    2. ඉලක්ක, ක්‍රියා පටිපාටිය, සම්පත් භාවිතය, කාලය, තක්සේරුව.
    3. නිපුණතා, ඉලක්ක, තක්සේරුව, කාලය, ඇගයීම.
    4. ඉලක්ක, සම්පත්, කාලය, ඇගයීම, සිසු ක්‍රියා. (........)

අ.පි.බ.

03. ඉගෙනුම් ක්‍රියාවලියේ දී ඉගෙනුම්-ඉගැන්වීම් සම්පත් ඵලදායීතා අනුපිළිවෙළට සකස් කරන ලෙසට දෙන ලද ක්‍රියාකාරකමට ගුරු සිසුන් ඉදිරිපත් කරන ලද ප්‍රතිචාර පහත දැක්වේ. ඒවායින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

1. චිත්‍රමය අත්දැකීම්, සංකේතමය අත්දැකීම්, ප්‍රදර්ශන අත්දැකීම්.
2. ප්‍රදර්ශන අත්දැකීම්, චිත්‍රමය අත්දැකීම්, ඍජු ක්‍රියාකාරී අත්දැකීම්.
3. ඍජු ක්‍රියාකාරී අත්දැකීම්, ප්‍රදර්ශන අත්දැකීම්, සංකේතමය අත්දැකීම්.
4. ඍජු ක්‍රියාකාරී අත්දැකීම්, සංකේතමය අත්දැකීම්, ප්‍රදර්ශන අත්දැකීම්. (........)

04. පාඩම් සැලසුමක් පංති කාමරයේ ක්‍රියාත්මක කිරීමේ දී ගුරුවරයකුගේ ඵලදායීතාව පිළිබිඹු කරන වඩාත් ප්‍රබල ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?

1. සෙමෙන් ඉගෙනුම ලබන සිසුන් කෙරෙහි අඩු අවධානයක් දැක්වීම යි.
2. විෂය කරුණු ආවරණය කෙරෙහි විශේෂ අවධානයක් දැක්වීම යි.
3. පාඩම් සැලැස්මට අනුකූලව ම පාඩම් ක්‍රියාත්මක කිරීම යි.
4. විවිධ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම, ක්‍රම ශිල්ප සහ සම්පත් අවස්ථාවෝචිත ව භාවිත කිරීම යි.

(........)

05. පහත දක්වා ඇති කරුණු කිනම් ඉගැන්වීම් ක්‍රමයට අයත් වන්නේ ද?

- ඉගැන්වීම් ක්‍රමයට වැඩි කාලයක් අවශ්‍ය ය.
- සම්පත් බහුල ඉගෙනුම් පරිසරයක් අවශ්‍ය ය.
- සිසුන් හඳුනා ගත් දැනුම නිසි ලෙස අර්ථකථනය වේ.

1. ශුද්ධ අනාවරණ ක්‍රමය
2. මඟපෙන්වන ලද අනාවරණ ක්‍රමය
3. කණ්ඩායම් ක්‍රියාකාරකම්
4. බුද්ධි කලම්බනය (........)

06. ඉගැන්වීමේ ක්‍රම පිළිබඳ ව දෙන ලද අත් පත්‍රිකාවක් කියවූ ගුරු සිසුවකු තබන ලද කෙටි සටහන් කිහිපයක් පහත දැක්වේ.

- සිසුන් විෂය කරුණු ගවේෂණය කොට ඉදිරිපත් කිරීම.
- සත්‍ය ජීවිත අවස්ථා ඉගෙනුමට සම්බන්ධ කිරීම.
- ස්වයං පෙළඹුම් ඉගෙනුම් අවස්ථා සම්පාදනය.

ඉහත කෙටි සටහන් හා සබැඳි අත් පත්‍රිකාවට වඩාත් උචිත මාතෘකාව වන්නේ කුමක් ද?

1. ඍජු ඉගැන්වීම් ප්‍රවේශයේ ගුණාංග
2. ශිෂ්‍ය කේන්ද්‍රීය ප්‍රවේශයේ ගුණාංග
3. මිශ්‍ර ඉගැන්වීම් ප්‍රවේශයේ ගුණාංග
4. විමසුම් පාදක ප්‍රවේශයේ ගුණාංග (........)

07. ගුරුවරයකුගේ ප්‍රත්‍යවේක්ෂණ ජර්නලයක උපුටනයක් පහත දැක්වේ.

"මාගේ පංති කාමරයේ සිසුන්ගේ කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ අනන්‍යතාව සහ විවිධතාව යි. විවිධතාවට ගැලපෙන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම යොදා ගැනීමේ කුසලතා මවිසින් ප්‍රගුණ කළ යුතු ය."

මෙවැනි පංති කාමරයකට වඩාත් සාර්ථකව යොදා ගත හැකි ඉගැන්වීම් ක්‍රමය ලෙස ඔබ යෝජනා කරන්නේ කුමක් ද?

1. බහුශ්‍රේණි ඉගැන්වීම
2. කණ්ඩායම් ක්‍රියාකාරකම්
3. බහුතල ඉගැන්වීම
4. ව්‍යාපෘති පාදක ඉගැන්වීම (........)

අ.පි.බ.

08 සාකච්ඡා ක්‍රමය යොදා ගනිමින් පාඩමක් ඉගැන්වීමට අපේක්ෂා කරන නවක ගුරුවරයකුට සාකච්ඡාව ආරම්භ කිරීම සඳහා ඵලදායීව යොදා ගත හැකි ඔබ යෝජනා කරන ක්‍රියාමාර්ගය කුමක් ද?

1. සිසුන්ට නිදහසේ අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීමෙන්
2. ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු දීමට අවස්ථාව ලබා දීමෙන්
3. රූපසටහනක් පෙන්වීමෙන්
4. ශිෂ්‍ය අත්දැකීම් මතු කරන ලෙස ප්‍රශ්න කිරීමෙන් (........)

09. පංතියේ අනෙක් සිසුන් හා සමාන වේගයකින් ඉගෙනුමෙහි යෙදිය නොහැකි සිසුන් කිහිප දෙනෙක් ද සිටින අවස්ථාවක ඔවුන් වෙනුවෙන් යොදා ගත හැකි ඉගැන්වීම් ක්‍රමය ලෙස ඔබ නිර්දේශ කරන්නේ කුමක් ද?

1. කණ්ඩායම් ක්‍රියාකාරකම් ක්‍රමය
2. සරල පියවර පාඩම් ක්‍රමය
3. ප්‍රශ්නකරණය ක්‍රමය
4. කේවල පැවරුම් ක්‍රමය (........)

10. නාට්‍යානුසාරයෙන් ඉගැන්වීමේ ශිල්පක්‍රම යොදා ගැනීමේ දී ඉටු කර ගත හැකි මනෝවිද්‍යාත්මක සහ සමාජවිද්‍යාත්මක අවශ්‍යතා පිළිවෙළින් ඇතුළත් පිළිතුර කුමක් ද?

1. ප්‍රදර්ශන හැකියාව, රංචු ලැදියාව
2. රංචු ලැදියාව, අනුකරණ ශක්තීන්
3. චලන රටා, බුද්ධිමය අවශ්‍යතා
4. අනුකරණ ශක්තීන්, නිර්මාපී බව (........)

11 කණ්ඩායම් සැකසීම, ඉලක්ක හඳුනා ගැනීම, කාර්යයේ යෙදීම, තක්සේරුව හා ප්‍රතිඵල බෙදා හදා ගැනීම යන පියවරවලින් සමන්විත වන සහයෝගී ඉගෙනුම (Collaborative Learning) වඩාත් සාර්ථකව යොදා ගත හැකි වන්නේ කුමන මට්ටමක සිසුන් සඳහා ද?

1. පූර්ව ළමාවියේ සිසුන් සඳහා ය.
2. පළමු ප්‍රධාන අවධියේ සිසුන් සඳහා ය.
3. කණිෂ්ඨ ද්විතීයික අවධියේ සිසුන් සඳහා ය.
4. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අවධියේ සිසුන් සඳහා ය.

(........)

12 කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා සිසුන් කණ්ඩායම් කිරීමේ දී ගුරුවරයා අනුගමනය **නොකළ යුතු** ක්‍රියාමාර්ගයක් වන්නේ කුමක් ද?

1. පේළි වශයෙන් අසුන්ගෙන සිටින පිළිවෙළට කණ්ඩායම් කිරීම යි.
2. සමාජ මිතික දත්ත ඇසුරෙන් කණ්ඩායම් කිරීම යි.
3. බුද්ධි මට්ටම් මිශ්‍ර වන ලෙස කණ්ඩායම් කිරීම යි. ,
4. නාම ලේඛනය පිළිවෙළට අනුව කණ්ඩායම් කිරීම යි. (........)

13 ගුරුවරයකුට ස්වයං වෘත්තීය සංවර්ධන අවශ්‍යතා ඉටු කර ගැනීමේ උපාය මාර්ගයක් ලෙස ප්‍රත්‍යවේක්ෂණ ජර්නලයක් පවත්වා ගැනීමෙන් ලැබෙන වඩාත් වැදගත් ප්‍රතිලාභයක් වන්නේ කුමක් ද?

1. තම කාර්යය ආපසු මෙනෙහි කරමින් ශක්තීන් ප්‍රවර්ධනයට සහ සංවර්ධනය විය යුතු අවස්ථා හඳුනා ගැනීමට හැකිවීම.
2. තම සිතෙහි ඇතිවන ගැටලු සටහන් කර, ආවේගවලින් නිදහස් වීමට හැකිවීම.
3. පංති කාමරයේ අඩුපාඩු හඳුනා ගැනීමට සහ ඒවා සපයා ගැනීමේ ක්‍රමෝපා තීරණයට හැකිවීම.
4. තමාගේ ඉගැන්වීමේ ශෛලිය හඳුනා ගැනීමට සහ වෙනස් කර ගැනීමට හැකිවීම. (........)

14 බොහෝ ආධුනික ගුරුවරුන්ගේ පාඩම් සැලසුම්වල පාඩම සංවර්ධනය යටතේ සඳහන් පියවර ලිවීමේ දී දක්නට ලැබෙන ප්‍රබලතම අඩුපාඩුව වන්නේ කුමක් ද?

1. භාවිත කරන සම්පත් දක්වා නොතිබීම ය.
2. ගුරු ක්‍රියා, සිසු ක්‍රියා වෙන් කර නොලිවීම ය.
3. සිසුන්ට යොමු කරන ප්‍රශ්න සඳහන් නොකිරීම ය.
4. ඒ ඒ පියවරේ දී මතු කරන විෂය කරුණු දක්වා නොතිබීම ය. (........)



අ.පි.බ.

15. ගුරුවරුන් කිහිප දෙනකු සමඟ එක් වී විෂය නිපුණතාවක් හා සබැඳි ක්‍රියාකාරකමක් ව්‍යාපෘති ක්‍රමයට ක්‍රියාත්මක කළ ද තමා අපේක්ෂා කළ ඉලක්ක සපුරා ගත නොහැකි වූ බව ව්‍යාපෘතිය භාර ගුරුවරයාගේ අදහස විය. ඉදිරියේ දී මෙම ගැටලුව නිරාකරණය සඳහා අනුගමනය කළ යුතු බවට ඔබ ඉදිරිපත් කරන නිර්දේශය කුමක් ද?

1. තනිව ම ව්‍යාපෘති ක්‍රමයට පාඩම ක්‍රියාත්මක කළ යුතු බව යි.
2. තමන්ට අදාළ වන ඉලක්ක සපුරා ගැනීමට පමණක් කටයුතු කළ යුතු බව යි.
3. ක්‍රියාකාරී සැලැස්මක් සකස් කොට අනෙක් ගුරුවරුන්ට වගකීම් පැවරිය යුතු බව යි.
4. වගකීම් සියල්ල සිසුන්ට හා දෙමාපියන්ට පැවරිය යුතු බව යි. (........)

16. පහත දක්වා ඇති ඉගෙනුම් අවස්ථාවලට වඩාත් ගැලපෙන ඉගෙනුම් ශිල්පක්‍රම පිළිවෙළින් ඇතුළත් පිළිතුර කුමක් ද?

L සිසුන් කණ්ඩායම් වශයෙන් වෙන් වී දාදු කැටයක් 10 වාරයක් උඩ දමා ලැබෙන අගය පොත්වල සටහන් කර ගැනීම.

M රථවාහන හැසිරවීමේ නියැලෙන පොලිස් නිලධාරියකුගේ කාර්යභාරය.

1. ක්‍රීඩා, භූමිකා රංගනය　　2. නාට්‍ය, භූමිකා රංගනය
3. ක්‍රීඩා, නාට්‍ය　　4. ක්‍රීඩා, ආදර්ශන (........)

17 පහත "අ" තීරුවෙහි සඳහන් ඉගැන්වීමේ ශිල්පක්‍රම හා සම්බන්ධ උදාහරණ "ආ" තීරුවෙන් ගලපා වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

| "අ" | "ආ" |
|---|---|
| 1. නිරීක්ෂණය | A ඉවත ලන ද්‍රව්‍යවලින් පරිසරයට ඇතිවන බලපෑම සලකා බැලීම. |
| 2. පරීක්ෂණය | B හැඩයෙන් සමාන ප්‍රමාණයෙන් අසමාන වස්තු හඳුනා ගැනීම. |
| 3. බුද්ධි කලම්බනය | C පාසල් වත්තේ තෝරා ගත් ශාකවල පත්‍ර කිහිපයක් ආවරණය කොට සිදුවන වෙනස්කම් සලකා බැලීම. |

1. 1-B, 2-C, 3-A　2. 1-C, 2-B, 3-A　3. 1-A, 2-B, 3-C　4. 1-B, 2-A, 3-C (........)

18. ගුරු කුසලතා සංවර්ධනයේ දී යොදා ගනු ලබන සූක්ෂ්ම ඉගැන්වීම් ක්‍රමය (ක්ෂුද්‍ර ඉගැන්වීම – Micro teaching) පිළිබිඹු කෙරෙන අවස්ථාවක් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. සමස්ත පාඩමේ හරය මතුවන සේ පාඩමට අදාළ ව ප්‍රශ්න සැකසීම යි.
2. විනාඩි 05ක කාලයක දී කුඩා කණ්ඩායමක් ඉදිරියේ කළු ලෑල්ල භාවිතය ප්‍රගුණ කිරීම යි.
3. විනාඩි 40ක දී පංති කළමනාකරණය කිරීමේ ක්‍රම යොදා ගැනීම ප්‍රගුණ කිරීම යි.
4. තනි තනි ව ගුරු සිසුන්ට තෝරා ගත් කුසලතා කිහිපයක් ප්‍රගුණ කිරීමට යොමු කිරීම යි.

(........)

19 ප්‍රදර්ශන ඉගැන්වීම් (Demonstration) අවස්ථාව හා සබැඳි ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ. ඒවායින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

1. ප්‍රදර්ශන පාඩම කරන්නාට මෙන් ම නිරීක්ෂණය කරන්නාට ද ඉගෙනුම් අවස්ථා උදා කෙරේ.
2. ප්‍රදර්ශන පාඩම නිරීක්ෂණය කරන්නාට පමණක් ප්‍රතිලාභ රැසක් අත් වේ.
3. ප්‍රදර්ශන පාඩම් සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම අපහසු ය.
4. සෑම විෂයයකට ම ප්‍රදර්ශන පාඩම් යොදා ගැනීම දුෂ්කර නොවේ. (........)

20. • **හේතුව** - ගුරුවරයා විෂය දැනුම මෙන් ම වෘත්තීය නිපුණතා ප්‍රගුණ කර ගත් අයකු වීම අත්‍යවශ්‍ය ය.

• **නිගමනය** - ඉගැන්වීමේ ශිල්පක්‍රම විෂයය ගුරුවරයා වෘත්තීය ගුරුවරයකු බවට පත්වීමේ මාර්ගෝපදේශ සපයයි.

1. හේතුව සහ නිගමනය අතර සම්බන්ධතාවක් නැත.
2. හේතුව සහ නිගමනය සත්‍ය වන අතර නිගමනයෙන් හේතුව පැහැදිලි නොකරයි.
3. හේතුව සහ නිගමනය සත්‍ය වන අතර නිගමනයෙන් හේතුව පැහැදිලි කරයි.
4. හේතුව සහ නිගමනය දෙක ම අසත්‍ය වන අතර සම්බන්ධතාවක් ද නොපෙන්වයි. (........)

(ලකුණු 01 x 20 = ලකුණු 20)

© [සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved.]

3210
උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.

විභාග දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் திணைக்களம்
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා - (2017/2018)
## අවසාන පරීක්ෂණය - 2019
## PE0180 (PE780) – ඉගැන්වීමේ ශිල්පක්‍රම

### II කොටස

**"අ"** කොටසින් **එක්** ප්‍රශ්නයක් ද **"ආ"** කොටසින් ප්‍රශ්න **හතරක්** ද බැගින් තෝරා ගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

**"අ"**

01. සෑම ගුරුවරයකු ම ඉගැන්වීමේ ප්‍රවේශ, ක්‍රම, පටිපාටිය හා ශිල්පක්‍රම අතර ඇති අන්‍යොන්‍ය සබඳතාවට අනුගත ව කටයුතු කිරීම අත්‍යවශ්‍ය ය.

(i) විෂය ඉගැන්වීමට අදාළ ව "ඉගැන්වීමේ ප්‍රවේශ" (Teaching Approach) තීරණයේ දී ගුරුවරයාට බලපාන ප්‍රධාන සාධක **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) ඉගැන්වීමේ ප්‍රවේශ හා ඉගැන්වීමේ ක්‍රම අතර ඇති සම්බන්ධතාව එක් උදාහරණයක් ඇසුරින් විග්‍රහ කරන්න. (ලකුණු 05)

(iii) ඔබගේ ප්‍රධාන විෂයයෙන් පාඩමක් තෝරා ගන්න. එම පාඩම සඳහා එක් ගුරු කේන්ද්‍රීය ක්‍රමයක් සහ එක් ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රමයක් බැගින් යෝජනා කරන්න. ඔබ තෝරා ගත් පාඩම යෝජිත ක්‍රම දෙකට ක්‍රියාත්මක කිරීමේ දී ඇති විය හැකි බලපෑම පහත ක්ෂේත්‍ර ඔස්සේ පැහැදිලි කරන්න.

- අපේක්ෂිත ඉගෙනුම් පල සාධනය
- ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ශිෂ්‍ය සහභාගිත්වය

(ලකුණු 08)

02. "ඉගැන්වීමේ සාමාන්‍ය ක්‍රම පිළිබඳ ව පුළුල් සහ නිවැරදි අවබෝධයක් ලබා තිබීම ගුරු කාර්යය ඵලදායී කරයි."

(i) ඉගැන්වීමේ සාමාන්‍ය ක්‍රම සහ ඉගැන්වීමේ විශේෂ ක්‍රම අතර ඇති සමානකමක් සහ වෙනස්කමක් දක්වන්න. (ලකුණු 03)

(ii) ඉගැන්වීමේ විශේෂ ක්‍රම තීරණය කිරීමේ දී ගුරුවරයා සැලකිලිමත් විය යුතු සාධක **පහක්** දක්වන්න. (ලකුණු 05)

(iii) "ඉගැන්වීමේ සාමාන්‍ය ක්‍රම රැසක් තිබුණ ද, සෑම විෂයකට ම සෑම ඉගැන්වීමේ ක්‍රමයක් ම යොදා ගැනීම අසාර්ථක වෑයමකි." මෙම ප්‍රකාශය ඔබගේ ප්‍රධාන විෂයය ආශ්‍රිත ව උදාහරණ **තුනක්** දක්වමින් සහේතුක ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

අ.පි.බ.

**"ආ"**

03. ප්‍රශ්නකරණය වෙනම ඉගැන්වීමේ ක්‍රමයක් ලෙස යොදා ගැනීමට වඩා වැදගත් වන්නේ අනෙකුත් ඉගැන්වීම් ක්‍රමවල දී ප්‍රශ්නකරණය ශිල්පක්‍රමයක් ලෙස යොදා ගැනීම යි.

(i) ඉහත ප්‍රකාශයට ඔබේ එකඟතාව කරුණු **තුනකින්** ඉදිරිපත් කරන්න. (ලකුණු 03)

(ii) ඉගෙනුම් ක්‍රම ශිල්පයක් වශයෙන් එක් එක් පියවරක දී ප්‍රශ්නකරණය යොදා ගැනීමේ දී ගුරුවරයකු සැලකිලිමත් විය යුතු සාධක **පහක්** දක්වන්න. (ලකුණු 05)

(iii) ඔබගේ ප්‍රධාන විෂයයෙන් පාඩමක් තෝරා ගන්න. එම පාඩමේ එක් පියවරක දී ප්‍රශ්නකරණය ශිල්ප ක්‍රමයක් වශයෙන් යොදා ගන්නා ආකාරය පහත ශීර්ෂ ඔස්සේ උදාහරණයක් ඇසුරින් පැහැදිලි කරන්න.

- අපේක්ෂිත විෂය කරුණු ඉදිරිපත් කිරීමේ දී
- විෂය කරුණු තහවුරු වී දැ'යි සොයා බැලීමේ දී

(ලකුණු 08)

04. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පාසල් මුහුණ පා ඇති අවාසිදායක තත්ත්ව ජය ගැනීමේ මාර්ගයක් වන්නේ බහු ශ්‍රේණි ඉගැන්වීම යොදා ගැනීම යි.

(i) බහු ශ්‍රේණි ඉගැන්වීම් ක්‍රමයේ මූලික ගුණාංග **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) බහු ශ්‍රේණි ඉගැන්වීම යොදා ගැනීමට සිදු වන්නේ කිනම් අවාසිදායක තත්ත්ව මගහරවා ගැනීම සඳහා ද යන්න හේතු **පහකින්** දක්වන්න. (ලකුණු 05)

(iii) බහු ශ්‍රේණි ඉගැන්වීමේ දී එහි දෙවන පියවර වන "අභ්‍යාස පියවර" (Practice) ක්‍රියාත්මක කරන ආකාරය ඔබගේ විෂය ආශ්‍රිත උදාහරණයක් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

05. අතීතයේ දී මෙන් ම වර්තමානයේ දී ද ද්විතීයික ශ්‍රේණි පංතිකාමරවල බහුලව යොදා ගන්නා ඉගැන්වීම් ක්‍රමයක් වන්නේ දේශන ක්‍රමය යි.

(i) දේශන ක්‍රමය යොදා ගැනීමට ගුරුවරුන් යොමු වීමට බලපා ඇති හේතු **තුනක්** දක්වන්න.

(ලකුණු 03)

(ii) දේශන ක්‍රමය ඉගැන්වීමේ ක්‍රමයක් ලෙස යොදා ගැනෙන පංති කාමරයක ඵලදායී ඉගෙනුමක් සිදු නොවන බව සනාථ කිරීමට ඉදිරිපත් කළ හැකි සාක්ෂි **පහක්** දක්වන්න. (ලකුණු 05)

(iii) දේශන ක්‍රමය බහුල වශයෙන් යොදා ගෙන ඔබගේ විෂයය උගන්වන නවක ගුරුවරයකුට එමගින් සිදුවිය හැකි අහිතකර ප්‍රතිඵල **තුනක්** දක්වා, ඒවා අවම කර ගැනීම සඳහා යොදා ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** විෂය ආශ්‍රිත ව උදාහරණ දක්වමින් යෝජනා කරන්න. (ලකුණු 08)

අ.පි.බ.

06. “වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍රයෙන් ඇරඹී ක්‍රමයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයට ද එක් වූ ගැටලු පාදක ඉගෙනුම් ක්‍රමය (Problem Based Learning Method) උසස් අධ්‍යාපනයේ දී මෙන් ම ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ දී ද සාර්ථක ව යොදා ගත හැකි ය.”

(i) ගැටලු පාදක ඉගෙනුම් ක්‍රමයේ ඇති විශේෂ ලක්ෂණ **තුනක්** දක්වන්න. (ලකුණු 03)

(ii) ගැටලු පාදක ඉගෙනුම් අවස්ථාවක් තෝරා ගැනීමේ දී ගුරුවරයා අනුගමනය කළ යුතු ප්‍රධාන පියවර **පහක්** ඉදිරිපත් කරන්න. (ලකුණු 05)

(iii) ඔබගේ ප්‍රධාන විෂයයෙන් ගැටලු පාදක ඉගෙනුම යොදා ගනිමින් ක්‍රියාත්මක කළ හැකි පාඩමක් තෝරා ගන්න. එය ක්‍රියාත්මක කරන ආකාරය අදාළ පියවර මගින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

07. “ප්‍රත්‍යවේක්ෂණය වූ කලී ගුරු කාර්යය මෙන් ම සිසු ඉගෙනුම ද අර්ථවත් කරන්නා වූ උපාය මාර්ගයකි.”

(i) ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයා ප්‍රත්‍යවේක්ෂණයේ යෙදිය යුතු ප්‍රධාන අවස්ථා **තුන** නම් කරන්න. (ලකුණු 03)

(ii) ඔබගේ ප්‍රධාන විෂය ඉගැන්වීමේ දී ප්‍රත්‍යවේක්ෂණයෙන් හඳුනා ගත් ඉගෙනුම් ගැටලු ක්ෂේත්‍ර **පහක්** නම් කරන්න. (ලකුණු 05)

(iii) එක් ගැටලු ක්ෂේත්‍රයකට අදාළ ව තෝරා ගත් සුවිශේෂී ගැටලුවක් විසඳීම සඳහා ඔබ ගන්නා ලද ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමෙන් පසු අවසාන ප්‍රත්‍යවේක්ෂණ පහත සඳහන් ශීර්ෂ ඔස්සේ උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

- ගුරුවරයා ලෙස ඔබ වෙනස් වූ ආකාරය
- ඉගෙනුම් ගැටලු සහිත සිසුන් වෙනස් වූ ආකාරය
- පංති කාමර පරිසරය වෙනස් වූ ආකාරය

(ලකුණු 08)

08. “ගුරුවරයාගේ ඉගැන්වීම මෙන් ම සිසුන්ගේ ඉගෙනුම ද ඵලදායී වීම රඳා පවතින්නේ ගුරුවරයාගේ ඉගෙනුම් සම්පත් තෝරා ගැනීම මෙන් ම ඒවා භාවිත කරන ආකාරය මත ය.”

(i) ගුරුවරයකුට යොදා ගත හැකි සමාජ සම්පත් වර්ග **දෙක** සහ ඒවාට **එක්** උදාහරණය බැගින් ඉදිරිපත් කරන්න. (ලකුණු 03)

(ii) ඔබගේ ප්‍රධාන විෂය ආශ්‍රිත ව තෝරා ගත් නිපුණතාවක් සංවර්ධනය සඳහා යොදා ගත හැකි ඉගෙනුම් සම්පත් **පහක්** නිපුණතාවට අදාළ පාඩම් මාතෘකා සහිත ව දක්වන්න. (ලකුණු 05)

(iii) ඉහත දක්වන ලද එක් ඉගෙනුම් සම්පතක් තෝරා ගන්න. එම ඉගෙනුම් සම්පත් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ඵලදායි කර ගැනීම සඳහා භාවිත කරන ආකාරය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

********